## පන්හිඳයි පින්සලයි

සිසිර දිසානායක

# අඹ ඇඹුල

“ තුහ් ! තුහ් ! තුහ් විතරක් ! ” පන්හිඳ කන්න කටට ගත්ත අඹ කෑල්ල බිමට දැම්මෙ අතේ තිබුණ කෑල්ලත් විසිකරන ගමන්. “මගේ අම්මෝ ඒ අඹවල ඇඹුල ! – මගෙ දත් ටිකත් හිරි වැටුණා……... ” පන් උන්නු තැනම බිම වාඩි වුණා.

“මෙන්න මෙයින් ටිකක් කටේ දාගත්තනං……… ! ” පින්සල මොනවාදෝ කුඩු ජාතියක් දෝතට අරන් ඇවිත් අන්ද මන්ද වෙලා උන්න පන්ට කවන්න හැදුවා.

“මින් ටිකක් කටේ දාගත්තනං ඇඹුල යාවි! ”

“මොනවද ඔය ? ” පන් තාමත් බිම.

“පුඩිං හදන්න ගෙනාව බයිකාබනේට් ! ”

“මාව නැති කරන්න හදනවද ? කොහෙන්ද ඔය අඹ ගැට උස්සන් ආවෙ? ”

“සන්ෂයින්වලින් ” පින් බිම වැටිලා තිබුණ අඹ කෑලි අහුලලා බයිකාබනේට් එක්කම “බින්” එකට දැම්මා.

“මදැයි අඹ ගේන්න ගිහින් තියෙන දුර……..” පන් කිව්වෙ තරහින්.

“එහේ ඉඳන් මෙහාට කෝච්චියේ එනකොට අඹ තැලෙන හන්දයි ටිකක් අමු අඹ ගත්තෙ.”

“ඔය අඹ හොඳයි ඇඹුලක් හදන්න. අපරාදෙ ; පහුගිය සතියේ පන්සලේ කෑම සල්පිලට හොඳ අඹ ඇඹුලක් හදාගෙන යන්න තිබුණා.” පන් හීල්ලුවා.

කිස්බරෝ ධම්ම සරණ විහාරස්ථානයේ අලුතින් හදන ධර්ම ශාලාවට බරපැන හොයා ගන්නයි සල්පිල පැවැත්වුණේ. මේ අලුත් වැඩේ ගැන ඔසී මහත්තයාත් එක්ක කතා කරලා දැන ගත්ත දේවල් ගැන සටහනක් තිව්වොත් හොඳා නේද කියලා පන්ට හිතුණා.

පසුගිය වතාවකදී විහාරස්ථානයේ දාගැබ ඉඳිකිරීම පිළිබඳව අපි සටහන් තැබුවෙමු. මෙම ඉඳිකිරීම් කර්මාන්තයේ මූලික පිඹුරුපත් අනුව පියවර තුනකි. පළමුවැන්න වූයේ විහාරස්ථානය හා ආවාස ගෙය ඉඳිකිරීමයි. දෙවැන්න චෛත්‍යය, බෝධිගරය, සහ හිටි පිළිම වහන්සේ නිම කිරීම. තෙවන පියවරට විහාරස්ථ දායක සභාව සමඟින් ඉඳිකිරීම් කමිටුව මේ වනවිට මුල පුරා ඇත්තේය. ධර්ම ශාලාව, පුස්තකාලය, කාර්යාලය, ගබඩාව සහ ප්‍රවිෂ්ඨ ශාලාව ඊට ඇතුලත්.

මුල් පියවර වූ සැළසුම් කටයුතුවලදී අශෝක රාජපක්ෂ ගෘහ නිර්මාණ ශිල්පියාණන්ගේ අදහස් මුල් විය. ඊට ඔසී ද සිල්වා ගෘහ නිර්මාණ ශිල්පියාණන්ගේ අදහස් ද එක්විය. ගොඩනැගිලිවල සැකිළි නිර්මාණය කරමින් ඉංජිනේරුමය අංශය පිළිබඳව වගකීම භාර ගනු ලැබූයේ ප්‍රියන්ත මෙන්ඩිස් මහාචාර්යවරයායි. ඊට දයාවංශ කථිකාචාර්යවරයාද හවුල් විය. කර්මාන්තයේ මූල්‍යමය අංශය ලලිත් රාජපක්ෂ මහත්මාගේ විෂයය දැනුම අනුව ක්‍රියාත්මක වෙයි. මීට අමතරව කර්මාන්තයට දායකත්වය ලබාදෙන පින්වතුන් බොහෝය.

පැති අටකින් යුත්, නැතහොත් අෂ්ඨාකාර වූ ගොඩනැගිල්ලේ පාදම නැතහොත් අත්තිවාරම වර ගැන්වා වානේ කම්බි යෙදූ කොන්ක්‍රීට් පටියකි. ගොඩනැගිල්ලේ බිත්තිවල අත්තිවාරම ලෙසින් යෙදුණ මෙම කොන්ක්‍රීට් පටිය (Strip Footing) අත්තිවාරම් කානු කපා යොදන ලදී.

අනෙක් ගොඩනැගිලිවලට වඩා මෙහි ඇති විශේෂත්වය වන්නේ මෙම කොන්ක්‍රීට් පටිය යා කෙරෙමින් ඉඳිකළ වර ගැන්වූ විශාල කොන්ක්‍රීට් තට්ටුවයි. (Concrete Slab) ගොඩනැගිල්ලේ බිම ලෑලිවලින් පමණක් ඇතිරූ කල, ඒ මත පියනග න්නන්ගේ පා හඬින් නිශ්ශබ්දතාවය බිඳී යයි. බණ භාවනාවන්හි යෙදෙන සැදැහැතියන්ගේ දැහැන් රකිනු වස් කොන්ක්‍රීට් තට්ටුවක් ඉඳිකිරීමටත් ඒ මත ලෑලි ඇතිරීමට පියවර ගන්නා ලද්දේ නිශ්ශබ්දතාවය හැකි පමණින් අවම කිරීමටයි.

මින් පෙර ඉඳිකළ ගොඩනැගිලිවල සැකිල්ල (Structure) තනිකර දැවයෙන් නිම විය. ඒ ද මෙම ඉඳි කිරීමේ සැකිල්ල මතු නොව වහලයේ කාප්ප




(Truss) පවා “ටී” (T) හැඩයේ වානේ බාල්ක (Beams) සහ කනු (Posts) වලින් සම්පූර්ණ විය. වහලය ආවරණය කෙරෙනුයේ පිහිටි ගොඩනැ-ගිලි අනුවමයි. බුද්ධ ප්‍රතිමා වහන්සේ තැන්පත් කිරීමට නියමිත ස්ථානයේ වහලය ආවරණය වන්නේ වීදුරු ආවරණයකිනි. වැඩි ආලෝකයක් ලබා ගැනීම සඳහාය ඒ.

ධර්මශාලාවේ සිට ප්‍රවිෂ්ඨ ශාලාවටත්, දැනට පවතින විහාර ගෙයටත් අවශ්‍ය විටෙක පමණක් විවෘත කළ හැකි ආවරණයකින් ඒ එකිනෙක වෙන් වෙයි. වැඩි පිරිසක් සහභාගි වන අවස්ථාවලදී එකී දාරුමය ආවරණ පලකය විවෘත කළ හැකි වන අතර අවශේෂ අවස්ථාවලදී එම කොටස් වෙන වෙනම භාවිතා කළ හැකියි.

මෙකී කරුණු දැන ගැනීම පිණිස අප ව යා කළ ගරු නාඹටුන්නේ විජිත ස්වාමීන් වහන්සේට පින්.

“අර පොඩි ඈයින්ගෙ වැඩේ ගැන මොකුත්……. ” පින් කොහේදෝ ඉඳලා එතෙන්ට කඩා වැටුණා.

“කාර්වතා සෙන්ටර්” එකේ සිංහල භාෂා පාසැලේ වාර්ෂික විවිධ ප්‍රසංගය පන්ගෙයි පින්ගෙයි හිත්වලට ඇස්වලට කඳුළු උනවපු ප්‍රසංගයක් වුණා.

පහන පත්තු කරන වෙලාවෙ සක් හඬ මැද්දෙ මඟුල් බෙර වාදනය වුණා. වාදනය අන්තිමට ගැටබෙරයේ අවසන් සුරලට ඉස්සරහම පේළියෙ ඉන්දවලා උන්නු පුංචි එවුන් ටික පුංචි කකුල්වලින් තාලෙට පොළවට ගහගෙන ගහගෙන ගිය හැටි දැකලා පින්ට හිනා.

“මෙහේ උපන්නත් ජානවලට, ලේ වලට, ඇට මිදුලුවලට අපේකම, අපේ බෙර තාලය කැවිලා තියෙන අපූරුව ! ” පින්ට හිතුනා. “මං ලියන්නද ඒ ගැන ? ” පින් ඇහුවා.

“හොඳා එහෙනං………” පන් පෑන සටහන් පොත උඩම තියලා නැගිට්ටා.

මුලින්ම දේශාභිමානී ගීයකුයි ගායනා වුනේ. 6-10 ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය ශිෂ්‍යාවොයි ඒ ඉදිරිපත් කළේ. “හෙළ කුල සිරිතයි බුලත් අතයි” අලුත් විදිහේ ඉදිරිපත් කිරීමක්. යුරෝපීය පන්නෙට ඇඳගත්ත දැරියක්, ගැමි විදිහට ඇඳගත් බුලත් අත් අරගත්තු දැරියන් පිරිසක් අතර සංවාදයක්. වසර දොළහේ තරුණ පුතෙක් ඉදිරිපත් කරපු නෘති ගීය මේ වාගේ වේදිකාවක අපිට බලාපොරොත්තු වෙන්න බැරි තරමට ගයන්න අපහසු ගීතයක්. ඒ “ ගම්බිර තෙදැති ” ගීතය. “අම්මා මාව දොයිකරන්න” ගීයට වසර 1-2 දරු දැරියෝ රංගනයක් ඉදිරිපත් කළා. වසර 3,4,5 දරුවො ඉදිරිපත් කරුප “පුහුල් හොරා කරෙන් දැනේ”. වසර 6-8 පන්තිවල දරුවන්ගෙ “අන්දරේ” වාගේ අංගවලින් ඒ දරුවන්ගේ රඟපෑමේ හැකියාවල් අගේට පෙනුනා. “ මට මෑනි වගේ ” ගීය ගැයූ දරුවා, ජන ගී ගැයූ දැරිය, යුග ගායනා ඉදිරිපත් කල වසර 11,12 දරු දෙන්නා ඒ අයගේ ගායන හැකියාවන් පෙන්නන්න ලැබුණ අවස්ථාව හොඳට ප්‍රයෝජනයට අරගෙන තිබුණා. “මීදුම උතුරන”, “සකල බුජං”, “රන් පොකුණෙන්”, “නිවාඩු කාලෙ ඇවිල්ලා ” වාගෙ ගීතවලට නැටුම්වලින් හපන්කම් පෙන්නපු අය අතරෙ විශේෂ දක්ෂකම් පෙන්නපු අයත් උන්නා. ඒ අය නැටුම් කාගෙ කාගෙන්හරි ඉගෙනගන්න අය වෙන්න ඇති. නිවේදන කටයුතු කළ දරුවාත් දැරියත් ඉවසිලිවන්තව හොඳින් උත්සවය මෙහෙයවූවා.

අපි කාගෙත් ඇස්වලට කඳුළු ඉනුවෙ දයානන්ද ගුණවර්ධනයන්ගේ “නරි බෑනා” ඉදිරිපත් කරපු වසර 9-10 දූ දරුවන්ගේ දක්ෂකම් දැකලා. මේ අය මේ නාට්‍යය අන්තර්ජාලයෙන් බලලා දෙබස්, ගීත ලියාගෙන, ඇඳුම් පැළඳුම් හොයාගෙන වේදිකාවෙ ඉදිරිපත් කළේ කිසිම අඩුපාඩුවක් නැතිව. අනේ ඇත්තටම; අපේ දැනුමෙ - තේරුමෙ හැටියට නම් කිසිම දොසක් කියන්න තිබුණෙ නෑ. ඇස්වහක් කටවහක් වදින්න එපා; මේ ළමයි තමුන්ගේම මහන්සියෙන් ඉගෙන ගෙන විනාඩි විස්සකට කෙටි කරගෙන කාටවත් කෙටි කරපු බව නොදැනෙන්න කරපු ඒ ඉදිරිපත් කිරීම ගැන නම් අපිට පුදුමයි. ඒ දේට උනන්දු කරපු ගුරුතුමියටත් ස්තූතිවන්ත වෙන්න ඕන. කලින් කිව්වා වගේම අපේ අයගේ ලේ නහර, ඇට මිදුලු ගානේ මේ දේවල් කැවිලයි තියෙන්නේ.

වසර 11-12 තරුණ දරුවන් ඉදිරිපත් කරපු “ නූර්ති ගී ” වැල අනිත් හිත් ඇදගන්න අංගය වුණා. ගීත විස්සක් විතර කොටස් ඉදිරිපත් කලේ ඒවාට නියමිත රංගනත් එක්ක. හරිම අපූරුයි දරුවනේ, හරිම ආඩම්බරයි ! මේවා අපේ ප්‍රවීණ කට්ටියට හොඳ පාඩම්. ඒ අයටත් මේ දේවල් දැකගන්න කොහෙන් හරි ඉඩක් ලැබුනොත් නම් තවත් අපූරුයි. “හරිම අපූරුයි. හරිම අපූරුයි ” පින්ට ඉබේටම කෑ ගැස්සුනා.

“මොකද බයිකාබනේට්වත් කැවුනද? ” පන් කාමරයට දුවගෙන ආවා.

සිසිර දිසානායක

## අවමංගල්‍ය ස්තුතිය



2009 නොවැම්බර් 5 වන දින පරලෝ සැපත්
අපේ ආදරණීය පුතණුවන් වන
නුවන් ලක්ෂාන් අමරකෝන්
රෝගාතුර වී රෝහලේ නතරව සිටින අවස්ථාවේ සිට
ඔහුගේ අවසන් කටයුතු සහ
සියලුම දානමය පින්කම් වලට
නන් අයුරින් සහය වූ ඔබ සැමට
අපේ හෘදයාංගම ස්තුතිය මෙයින් පුද කරමු

ශාන්ත කුමාර, සුදර්ශිනී කුමාරි ඇතුළු පවුලේ සැම